# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல්ල.
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
Fax 011 286 4051


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. 2024/01 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2024.07.05 |

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු/ ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)
සියලුම ප්‍රාදේශීය ලේකම්වරු
සියලුම සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

**ඉඩම් නොමැති රණවිරුවන්ගේ පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබාදීම.**

01. ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය වෙනුවෙන් ක්‍රියාන්විත සේවයේ යෙදී සිට දිවි පිදූ, අතුරුදහන් වූ, පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ, විශ්‍රාමික සහ දැනට සක්‍රිය සේවයේ යෙදී සිටින ත්‍රිවිධ හමුදාවේ, ශ්‍රී ලංකා පොලිසියේ, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් හා ඔවුන්ගේ යැපෙන්නන් රැකබලා ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව රණවිරුවන්ට පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබා දීමේ දී සහන සැලසීම වඩාත් විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් රණවිරු ඉඩම් සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අංක 24/0898/601/058 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2024.05.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය හිමිව ඇත.

02. එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රණවිරුවන්ට ඉඩම් ලබා දීමේ දී තවදුරටත් සහන ලබා දීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව උපදෙස් ලබා දීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

03. ඒ අනුව රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් නොමැති රණවිරුවන්ගේ පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබා දීම මැයෙන් නිකුත් කර ඇති මගේ අංක 2021/01 සහ 2021.02.09 දිනැති චක්‍රලේඛය අවලංගු කරනු ලබන අතර ඉදිරියේදී රණවිරුවන්ට රජයේ ඉඩම් ලබා දීමේ දී මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු වේ.

**4. මෙම චක්‍රලේඛය අනුව හිමිවන ප්‍රතිලාභ පහත පරිදි වේ.**

4.1 විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරාගනු ලබන රණවිරුවන්ට, ඉඩම සංවර්ධනය කර පදිංචි වීමෙන් පසු ගාස්තු අය කිරීමකින් තොරව රජයේ ඉඩම් ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ එකවර නොමිලේ නිදහස් දීමනාපත්‍රයක් ලබා දීම.

4.2 මේ දක්වා ඉඩම සංවර්ධනය කර නොමැති රණවිරුවන්ට රජයේ ඉඩම් ආඥා පනතේ 06 වන වගන්තිය යටතේ වාර්ෂිකව රු.100.00 ක නාම මාත්‍ර බදු මුදලක් යටතේ බදු අනුමැතිය ලබා දෙන අතර, ඉන් අනතුරුව බදුකරයක් ලබා දීම.



CamScanner

4.3. එම බදුකරුවන්ගේ අපේක්ෂිත සංවර්ධනයන් සාක්ෂාත් කරගැනීමට හැකිවනු පිණිස බදුගත් ඉඩම ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත මූල්‍ය ආයතනයකින්, මූල්‍ය පහසුකම් ලබා ගැනීම පහසු වන පරිදි බදුකරයේ 21 වන කොන්දේසිය පහත පරිදි සංශෝධනය කර ඇතුලත් කරනු ලැබේ.

> *" ඉඩම සඳහා විධිමත් පරිදි බදුකරයක් නිකුත් කිරීමෙන් පසු මෙම ඉඩම මහ බැංකුවේ අනුමත මූල්‍ය ආයතනයක් සඳහා උකස් කිරීමට හෝ පවුලේ ආසන්නතම ඥාතියෙකුට පැවරීම කල හැක"*

4.3.1. විශේෂිත රණවිරු සහනයක් ලබා දී ඇති බැවින් පවුල් ඒකකයෙන් පරිබාහිරව වෙනත් පාර්ශවයන් සඳහා අතුරු බදු දීම හෝ අන්සතු කිරීම කල නොහැක.

4.4.2. බදු අනුමැතිය ලැබුන වහා බදුකරයක් ඉල්ලා සිටීමට හැකියාව ඇත.

4.4.රජයේ ඉඩම් ආඥා පනතේ 06 වන වගන්තිය යටතේ කොන්දේසි සහිත විශේෂ දීමනාපත්‍ර ලබා ඇති රණවිරුවන්ගේ දීමනාපත්‍ර, රජයේ ඉඩම් ආඥා පනතේ 20 වන වගන්තියෙන් සලසා දී ඇති ප්‍රතිපාදන ප්‍රකාරව කොන්දේසි ඉවත් කර පෘෂ්ඨාංකනය කිරීම හා විධිමත් ලෙස ලියාපදිංචි කිරීම.

4.5 ඉඩම් සංවර්ධන ආඥා පනතේ, ගැනුම් මිල කාණ්ඩය යටතේ සුදුසුකම් ලබා ඇති රණවිරුවන් සඳහා අදාල ඉඩම් නේවාසික පදනමකින් සංවර්ධනය කර ඇත්නම් අදාල ගැනුම් මිලෙන් නිදහස් කර උරුමය වැඩසටහන යටතේ, උරුමය නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගත හැකිය.

4.6. රජයේ ඉඩම් ආඥා පනත යටතේ විශේෂ බදුකර ලබා ගැනීම හා නිදහස් දීමනාපත්‍ර ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නිකුත් කරන ලද මැනුම් ඉල්ලීම්වලට අදාළ පිඹුරුපත් හා රේඛා චිත්‍ර ලබා ගැනීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මැනුම් ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ.

**<u>5. ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන රණවිරු කාණ්ඩ</u>**

5.1. 2009.06.01 දිනට පෙර සේවයට බැඳී ක්‍රියාන්විත රාජකාරිවල නිරත වූ පදිංචියට ඉඩමක් නොමැති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ/ නාවික හමුදාවේ/ ගුවන් හමුදාවේ/ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් මෙම රණවිරු ප්‍රතිලාභ යටතේ ආවරණය වේ.

I. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට (විවාහක නම් කලත්‍රයාට/ කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවෙකුට/ අවිවාහක නම් මව හෝ පියා)

II. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී අතුරුදහන් වූ රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට (විවාහක නම් කලත්‍රයාට/ කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවෙකුට/ අවිවාහක නම් මව හෝ පියා)

III. ක්‍රියාන්විත රාජකාරිවල යෙදී සිට ඇති වෙනත් හේතුවක් මත මියගිය රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට ( විවාහක නම් කලත්‍රයාට/ කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවෙකුට/ අවිවාහක නම් මව හෝ පියා)

IV. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන්ට

V. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී අර්ධ ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන්ට

VI. ක්‍රියාන්විත සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය රණවිරුවන්ට

VII. දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්ට

CS CamScanner

උක්ත IV – VII දක්වා කාණ්ඩ යටතේ රණවිරුවාගේ කලත්‍රයා ඉඩම් කච්චේරි සඳහා ඉදිරිපත්ව ඇති අවස්ථාවක කලත්‍රයාද මෙම රණවිරු ප්‍රතිලාභ යටතේ ආවරණය වේ.

## 6. ප්‍රතිලාභ සඳහා ක්‍රියා කළ යුතු ආකාරය.

6.1. ඉහත අංක 5 න් දැක්වෙන පරිදි සුදුසුකම් ලබන රණවිරුවන් හා ඔවුන්ගේ ළඟම ඥාතීන්ට රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය හා 20 රෙගුලාසිය යටතේ ඉඩම සංවර්ධනය කර ඇති අවස්ථාවල දී තොම්ලේ දීමනාපත්‍රයක් ලබා දිය හැකිය. දීමනාපත්‍රය නිකුත් කරන තෙක් එම ඉඩම් සංවර්ධන කටයුතු විධිමත් ලෙස ආරම්භ කිරීම සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු අනුමැතියක් ලබා ගත යුතු බැවින් ඒ සඳහා පහත දැක්වෙන නිර්දේශ වාර්තා පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මඟින් මා වෙත එවිය යුතුය.

I. ඉල්ලීම් ලිපිය
II. 19 පරිශිෂ්ය වාර්තාව
III. තත්ත්ව වාර්තාව
IV. බදු ගෙවන බවට දිවුරුම් ප්‍රකාශය
V. 17 පරිශිෂ්ය වාර්තාව
VI. ඉඩම් කච්චේරි අවසන් තේරීම් ලැයිස්තුව
VII. අදාළ පළාත් පාලන ආයතනයේ එකඟතාව
VIII. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික පිටපත
IX. විවාහක නම් විවාහ සහතිකයේ සහතික කල පිටපත
X. ප්‍රතිලාභ හිමිකම නිර්දේශ කරන ආයතනයේ නිර්දේශය
XI. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය
XII. පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය

6.2. සුදුසුකම් ලබන ප්‍රතිලාභීන් වෙත රු.100.00ක නාමික බදු මුදලක් යටතේ දීර්ඝකාලීන බද්දක් ලබා දෙන අතර බදුකරු ඉඩම සංවර්ධනය කර ස්ථිරව පදිංචි වීමෙන් පසුව තව දුරටත් ගාස්තු අය කිරීමෙන් තොරව දීමනාපත්‍රය ලබා දීම සඳහා නිර්දේශ වාර්තා මා වෙත එවිය යුතුය. ඒ සඳහා පහත නිර්දේශ වාර්තා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් / අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මඟින් මා වෙත එවිය යුතුය.

I. ඉල්ලීම් ලිපිය
II. දීමනාපත්‍රය සලකා බැලීමේ වාර්තාව
III. අයවිය යුතු නාමික බදු මුදල අයකර ගත් බවට ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය හා ඊට අදාළ රිසිට්පත්/ලෙජරයේ සහතික පිටපත
IV. O රේඛා චිත්‍රය ලබා ගැනීම සඳහා වූ මැනුම් ඉල්ලීමේ පිටපත

CamScanner

6.3 එකවර දිමනාපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඉහත 6.1 සහ 6.2 හි දැක්වෙන ලේඛන අතුරින් අයවිය යුතු නාමික බදු මුදල අයකර ගත් බවට ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය හා ඊට අදාළ රිසිට්පත්/ලෙජරයේ සහතික පිටපත හැර අනෙකුත් සියලු නිර්දේශ වාර්තා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් / අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මගින් මා වෙත එවිය යුතුය.

6.4. මේ වන විටත් රජයේ ඉඩමක් බදු පදනම මත පදිංචිය සඳහා ලබා දීමට ගරු ඉඩම් අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති හෝ බදුකරයක් නිකුත් කර ඇති සුදුසුකම්ලත් රණවිරුවන් සඳහා ද මෙම චක්‍රලේඛයේ සඳහන් සහන ලබා දිය හැකිය. එම අවස්ථාවේ දී එම රණවිරුවන්ට ලබා දී ඇති බදු අනුමැතිය සංශෝධනය කල යුතු බැවින් මෙම චක්‍රලේඛයේ 7 හි දක්වා ඇති ආදාළ ආයතනයේ නිර්දේශය (මීට පෙර ලබාගත්) සමඟ ඔබගේ නිර්දේශය පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මගින් මා වෙත එවිය යුතුය.

6.5. මේ වන විටත් රජයේ ඉඩම් ආඥා පනතේ 06 වන වගන්තිය යටතේ කොන්දේසි සහිත විශේෂ දීමනාපත්‍ර ලබා දී ඇති රණවිරුවන්ගේ දීමනාපත්‍ර, රජයේ ඉඩම් ආඥා පනතේ 20 වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදන ප්‍රකාරව පෘෂ්ඨාංකනය කිරීම සඳහා පහත ලේඛන මා වෙත එවිය යුතුය.

I. දීමනාපත්‍රය සහ අනු පිටපත්02
II. ඉල්ලීම් ලිපිය
III. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

6.6. ගැණුම් මිල කාණ්ඩය යටතේ සුදුසුකම් ලබා ඇති රණවිරුවන් සඳහා උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා දීමට අයදුම්කල යුතු ආකාරය.

උරුමය වැඩසටහන සඳහා මගේ 2023/01 හා 2023.12.21 දිනැති චක්‍රලේඛය හා 2024.06.30 දිනැති උපදෙස් ලිපියේ සඳහන් උපදෙස් අනුව e- Slims පද්ධතිය හරහා යොමු කළ යුතුය. එහිදී මෙය රණවිරු සහනය යටතේ ගැනුම් මිලෙන් නිදහස් කිරීම සඳහා කටයුතු කරනු ලබන බව සටහන් කරන්න. එසේම මෙම චක්‍රලේඛයේ 7 යටතේ දන්වා ඇති පරිදි ප්‍රතිලාභ හිමිකම සඳහා නිර්දේශ ලබා ගැනීම යටතේ දක්වා ඇති නිර්දේශය ඇමුණුම් ලෙස ඇතුල් කළ යුතුය.

**7. ප්‍රතිලාභ හිමිකම සඳහා නිර්දේශ ලබා ගැනීම.**

මේ යටතේ හිමිකම් ලබන අයදුම්කරුවන් තම ඉල්ලීමට අදාළව පහත පරිදි නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

I. ක්‍රියාන්විතයේ දී මිය ගිය/ අතුරුදහන් වූ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්/ රණවිරු පවුල් සඳහා රණවිරු සේවා අධිකාරිය
II. සේවයෙන් විශ්‍රාම ගිය/ සේවයේ යෙදී සිටිය/ අනෙකුත් හේතූන් මත මියගිය හා ආබාධිත රණවිරුවන් සඳහා හමුදා මූලස්ථාන නිර්දේශ මත ආරක්ෂක අමාත්‍යාංශයේ සන්නද්ධ හමුදා සුබ සාධක අංශය
III. පොලිස් නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
IV. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

08. මෙම චක්‍රලේඛය 2024.07.05 දින සිට ක්‍රියාත්මක වන අතර, 2021/01 හා 2021.02.09 දිනැති චක්‍ර ලේඛය මගින් මේ වන විටත් බදු ලබා දී ඇති රණවිරුවන්ට මෙම චක්‍රලේඛය මගින් සහන සැලසීමේ දී රජයට අයකල මුදල්

CS CamScanner

නැවත ආපසු ගෙවීමක් හෝ හිලව් කිරීමක් සිදු කරනු නොලැබේ. බදුකරුවන් ඉඩම් සංවර්ධනය කර ස්ථිර පදිංචි වී දීමනාපත්‍රයක් ඉල්ලුම්කරන දින දක්වා රු.100.00 ක වාර්ෂික නාමික බදු මුදල අඛණ්ඩව ගෙවිය යුතු වේ.

09. රණවිරුවන් විසින් නේවාසික පදනමින් භුක්ති විඳින හා බැහැර කිරීමට හඳුනාගන්නා යෝජිත රජයේ භූමි ප්‍රදේශයන්ට අදාළව යෝජිත සහනදායී ක්‍රමවේද අනුගමනය කරමින් සියලු රණවිරු කාණ්ඩයන් වෙත නිරවුල් භූමි හිමිකාරීත්වය ලබා දීමේ මෙම ජාතික වැඩසටහන මාස 04 ක් ඇතුළත ක්‍රියාත්මක කර එහි ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත බැවින් ඔබගේ විශේෂ අවධානය මේ සම්බන්ධයෙන් යොමු කරන ලෙස දන්වමි.

මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේ දී යම් ගැටළුවක් වෙතොත් මා වෙතින් වැඩිදුර උපදෙස් ලබා ගැනීමට ක්‍රියා කරන මෙන් කාරුණිකව දන්වමි.

කේ.ඩී.බන්දුල ජයසිංහ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය | - කා.දැ.ගැ.ස |
| 02 අග්‍රාමාත්‍ය ලේකම්,අග්‍රාමාත්‍ය කාර්යාලය | - කා.දැ.ගැ.ස |
| 03 ලේකම්, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | -කා.දැ.ගැ.ස |
| 04.ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස |
| 05.ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස |
| 06. ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස |
| 07. ත්‍රිවිධ හමුදාපතිවරු | - කා.දැ.ගැ.ස |
| 08. පොලිස්පති | - කා.දැ.ගැ.ස |
| 09. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | - කා.දැ.ගැ.ස |
| 10.දිස්ත්‍රික් ලේකම්වරු | - කා.දැ.ගැ.ස |
| 11. සභාපති, රණවිරු සේවා අධිකාරිය | - කා.දැ.ගැ.ස |

CamScanner